# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**1976 අංක 29 දරන ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා විසින් 2017 සැප්තැම්බර් මස 19 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 අගෝස්තු මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[206 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 12.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**1976 අංක 29 දරන ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1976 අංක 29 දරන පනත මගින් ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය සංස්ථාගත කරනු ලැබූ හෙයින් ද: *පූර්විකාව.*

ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී එකී සංස්ථාවේ අරමුණු වඩාත් සක්‍රීය ලෙස ඉටු කිරීමේ කාර්යය සඳහා ඉහත කී 1976 අංක 29 දරන පනතට ඇතැම් සංශෝධන ගෙන ඒමට යෝජනා සම්මත කර ඇති හෙයින් ද:

ඉහත කී යෝජනා සම්මතය බලාත්මක කිරීමේ කාර්යය සඳහා ඉහත කී පනත සංශෝධනය කරන ලෙස එකී සංස්ථාවේ කළමනාකරණ කමිටුව ඉල්ලීමක් කර ඇති හෙයින් ද, සහ එම ඉල්ලීමට ඉඩදීම මහජන හිතසුව පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2017 අංක      දරන ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** 1976 අංක 29 දරන ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) පනතේ 3 වන වගන්තිය තවදුරටත් පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *1976 අංක 29 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) එම වගන්තියේ (උ) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

''(උ) කොළඹ 12, රිෆායි තංගල් වීදියේ අංක 30 යන ස්ථානයේ පිහිටි මොහිදීන් තක්කියා හි පරිපාලනය, කළමනාකරණය සහ නඩත්තුව;'';

2—PL 005390—300 (2017/08)

(2) (උ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:—

''(ඌ) උසස් පෙළ දක්වා අධ්‍යාපනය සහ අල්-කුරාන්, අරාබි භාෂාව ඇතුළුව ඉල්-අලිම්/අල්-අලිමා සහ මවුලවි/මවුලවියා පාඨමාලා ඉගැන්වීම සඳහා ගැහැණු සහ පිරිමි පාසල් ස්ථාපිත කිරීම;

(ඍ) වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඎ) වැලිගම, කපුවත්ත ප්‍රදේශයේ පිහිටි රිෆායියා අරාබි බාලිකා විදුහල පරිපාලනය, කළමනාකරණය සහ නඩත්තු කිරීම;

(ඏ) වැලිගම, කපුවත්ත ප්‍රදේශයේ පිහිටි රිෆායියා අරාබි පිරිමි විදුහල පරිපාලනය, කළමනාකරණය සහ නඩත්තු කිරීම;

(ක) වැලිගම, කපුවත්ත ප්‍රදේශයේ පිහිටි මුහියද්දීන් ජුම්මා පල්ලිය හා දේපළ පරිපාලනය, කළමනාකරණය සහ නඩත්තු කිරීම;

(ග) වැලිගම, කපුවත්ත ප්‍රදේශයේ පිහිටි රිෆයියා කුරාන් මද්රාසා මධ්‍යස්ථානය පරිපාලනය, කළමනාකරණය සහ නඩත්තු කිරීම;

(ච) සංගමයේ චංචල හා නිශ්චල දේපළ පරිපාලනය, කළමනාකරණය සහ නඩත්තු කිරීම;''.

**3.** 1976 අංක 29 දරන ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) පනතේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන නව උපවගන්තිය ඇතුළත් කිරීමෙන් 5 වන වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

1976 අංක 29 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

''(3) සංවිධානයේ ආරම්භක ආධ්‍යාත්මික නායකයන්ගේ ඉල්ලා අස්වීමෙන් හෝ මරණයෙන් පසුව අති උතුම් රිෆායි මවුලානා යූ. පී. සෙයියද් මුහම්මද් ආෂීක් තංගල් යන අය සංවිධානයේ ආධ්‍යාත්මික නායකයා වන අතර, ඉන් පසුව ඔවුන්ගේ පවුලේ සාමාජිකයකු නායකත්වයට පත්විය යුතු ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.